// 
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2261/11 – 2022 ජනවාරි මස 04 වැනි අඟහරුවාදා – 2022.01.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2018/175.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2021.04.23 වැනි දින අංක 2224/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.03.30 වැනි දින දරන නියෝගයෙන්,

ඩබ්ලිව්. ඒ. විජේදාස මයා, නිල්මිණි නිවස, නාගොල්ල, කුට්ටියගොල්ල, බදුල්ල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2021.03.25 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පන්වත්තේ ගෙදර සරත් ප්‍රේමලාල් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2021.03.30 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා (පා.ම.),**
කම්කරු අමාත්‍ය.

2021 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

EOG 01 - 0011/1

1A – G 35730 – 10 (2022/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/05/2018/175.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ඩබ්ලිව්. ඒ. විජේදාස මයා, නිල්මිණි නිවස, නාගොල්ල, කුට්ටියගොල්ල, බදුල්ල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, හිග්ගෝල්ල පාර, පළමු පටුමග, අංක 34/64, ඒ. බී. හේරත් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා (පා.ම.),**
කම්කරු අමාත්‍ය.

2021 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2018/175.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩබ්ලිව්. ඒ. විජේදාස මයා, නිල්මිණි නිවස, නාගොල්ල, කුට්ටියගොල්ල, බදුල්ල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''වයස අවුරුදු 57 සම්පූර්ණ වීම මත 2013.10.05 දිනැතිව විශ්‍රාම ගන්වා ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කළ ඩබ්. ඒ. විජේදාස මහතා 2015.04.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත සේවයේ පිහිටුවුව ද, 2013.10.05 සිට 2015.04.24 දක්වා කාලයට වැටුප් නොගෙවීමෙන් ඒ මහතාට අසාධාරණයක් සිදු වී තිබේ ද? අසාධාරණයක් සිදුවී ඇත්නම් කුමන සහන හිමිවිය යුතු ද? යන්න පිළිබඳ වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 01 - 0011/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.